# <u>චිත්‍ර අඳිමු. ලක්ෂ ගණනින් තෑගි දිනමු!</u>

## ජපානයේ ECF සංවිධානයේ අනුග්‍රහයෙන් සහ Sputnik ජාත්‍යන්තරයේ මෙහෙයවීමෙන් පවත්වනු ලබන

## <u>"WHITE CANVAS" Painting Competition – 2023</u>

### <u>අරමුණ</u>

2020 වසරේ සිට ආරම්භ කර වාර්ෂිකව පවත්වනු ලබන මෙම චිත්‍ර තරගයේ මූලික අරමුණ වන්නේ ආසියාවේ සිටින දක්ෂ චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ IT තාක්ෂණය හා මුසු කිරීමෙන් එම නිර්මාණයන්හි අයිතීන් සුරක්ෂිත කර ආසියානු චිත්‍ර කලාව නව මාවතකට විවර කිරීමයි. ප්‍රධාන වශයෙන් එක් එක් රටවල් ස්වාධීනව තරග පවත්වනු ලැබේ. වෘත්තීමය කලාකරුවන් පමණක් නොව පාසල් සිසුන් සහ නවක තරුණයන් අතර ද චිත්‍ර ඇඳීමේ සතුට, ප්‍රමෝදය ඇති කිරීම හා වර්ධනය කිරීම මෙම චිත්‍ර තරගයේ තවත් අරමුණකි.

මෙම තරගයෙන් තෝරා ගනු ලබන චිත්‍ර සඳහා ඉතා වටිනා මූල්‍යමය ත්‍යාග, කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කිරීමට නියමිතය. එපමණකින් නොනැවතී, එම නිර්මාණ අන්තර්ජාල මාධ්‍යය තුල ප්‍රදර්ශනය කිරීම සහ ජපානයේ කලාගාරයන් තුල ප්‍රදර්ශනය කරවා චිත්‍ර එකතු කරන්නන්හට මිළදී ගැනීමට අවස්ථාවද උදාකර දෙනු ඇත. මෙමගින් දක්ෂ කලාකරුවන්හට අන්තර්ජාතික චිත්‍ර කලා අධ්‍යක්ෂකවරුන්ගේ අවධානය දිනා ගැනීමට අවස්ථාව ලැබෙන අතර තම කලා දිවි ගමනේ ඉදිරියට යාමට මං පෙත් විවර වනු ඇත.

### <u>වයස් කාණ්ඩ</u>

ශ්‍රී ලංකාවේ තරග වටය ස්වාධීනව"ළමා" සහ "විවෘත" වශයෙන් ප්‍රධාන වයස් කාණ්ඩ 2 ක් යටතේ පවත්වනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| ළමා කාණ්ඩය | - | 1. | 12 ට අඩු | (2012.01.01 ට පසු උපන් අය) |
| | | 2. | 12 – 18 ත් අතර | (2006.01.01 – 2011.12.31 අතර උපන් අය) |
| විවෘත අංශය | - | | වයස 18 ට වැඩි | (2005.12.31 ට පෙර උපන් අය) |


### <u>කාල සටහන</u>

- අයදුම් කාල සීමාව - 2023 මැයි 10 සිට අගෝස්තු 10 දක්වා.
  (අගෝස්තු 10 න් පසු ලැබෙන නිර්මාණ තරගය සඳහා ඉදිරිපත් කරනු නොලැබේ)
- විනිශ්චය කාල සීමාව - අගෝස්තු 11 සිට.
- ප්‍රතිඵල නිවේදනය - සැප්තැම්බර් හා ඔක්තෝබර් මස තුළ දී.
- ත්‍යාග ප්‍රදානෝත්සවය - නොවැම්බර් මස තුළ දී.
- කලාගාර ප්‍රදර්ශනය - 2023 නොවැම්බර් මස දී.

<u>තරඟ කොන්දේසි</u>

- තේමාව - ඕනෑම තේමාවක් යටතේ ඉදිරිපත් කළ හැක. එය ඔබ විසින් සිතුවම් කරන ලද චිත්‍රයක් විය යුතුය. අවසන් වටයට ඔබගේ නිර්මාණය නිර්දේශ කළ හොත් ඔබ විසින් ඉදිරිපත් කරන නිර්මාණයේ සත්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අප ආයතනයට පැමිණ චිත්‍රයක් සිතුවම් කළ යුතුය. එදින ඔබගේ නිර්මාණයේ මුල් පිටපත රැගෙන ආ යුතුය.
- Google අයදුම්පත පුරවා Google මාර්ගය ඔස්සේ එවන ලද චිත්‍ර පමණක් භාර ගන්නා අතර WhatsApp මාර්ගයෙන් සහ තැපෑලෙන් එවන කිසිදු නිර්මාණයක් භාර නොගන්නා බව කරුණාවෙන් සළකන්න.
- ඔබ විසින් අප වෙත එවන නිර්මාණ අවම වශයෙන් පසුගිය වසරක කාලයක් තුළ සිතුවම් කරන ලද නිර්මාණයක් විය යුතුයි. කාල සීමාව ඉක්ම වූ පැරණි නිර්මාණ විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- එක් තරඟකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- තම චිත්‍රය දේශීයව හෝ ජාත්‍යන්තරව අළෙවි කිරීමට භාජනය කරන්නේ නම් තම චිත්‍රයේ වටිනාකමද අයදුම් පත්‍රයේ සඳහන් කරන්න.
- චිත්‍රය ඇඳිය යුතු පෘෂ්ඨය - Drawing paper, Kent Paper, Canvas Paper , Art Paper සහ බ්‍රිස්ටල් බෝඩ් පමණි. ලෑලි, වීදුරු, ප්ලාස්ටික් ආදී ඝන මතුපිටක් නොවිය යුතුය. රාමු කර නොතිබිය යුතුය.
- මාධ්‍යය - තමන් කැමති ඕනෑම මාධ්‍යකින් හෝ මාධ්‍ය කිහිපයක එකතුවකින්. උදා : පැස්ටල් , ක්‍රේ යෝන් , Water Colors , Oil Painting , Pencil, Pen ආදී
- විශාලත්වය - චිත්‍ර නිර්මාණයේ දිග 50 cm – 100 cm අතර සහ පළල 50 cm – 100 cm අතර විය යුතුය. ( එනම් 50 cm සහ 100 cm අතර ඕනෑම දිගක් සහ පළලක්)
- මුදල් ත්‍යාගය හිමිවන්නේ ත්‍යාග සහ සහතික පත් ප්‍රදානෝත්සවයට සහභාගී වන්නන්ට පමණි.
- *ජයග්‍රහණය කරන ලද ත්‍යාග හිමි වූ නිර්මාණ ස්පුටනික් ආයතනය සතු වන බව කරුණාවෙන් සලකන්න.*
- සහතිකය පැමිණ හෝ කුරියර් ගාස්තු ගෙවා තැපෑලෙන් ගෙන්වා ගැනීමේ අයිතිය ඔබ සතුය.

උදාහරණ :



## අයදුම් කිරීමේ ක්‍රමය

- කැමරාවකින් හෝ **Smart Phone** එකකින් තම නිර්මාණය ඡායාරූපගත කර අප සඳහන් කර ඇති දිගුව ( **Link** ) ඔස්සේ ඔබට ලබාදී ඇති අයදුම්පත්‍රය ( **Google Form** ) පුරවන්න. **>> Submit** බොත්තම ඔබන්න. අයදුම්පත්‍රය පුරවන අවස්ථාවේදී ඔබගේ ජා.හැ.ප ( **NIC** ) හෝ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් උඩුගත ( **Upload** ) කරන්න.

## Google Form සඳහා පිවිසුම් දිගු (Links)

**ළමා කාණ්ඩය -** https://docs.google.com/forms/d/e/1FAIpQLScRsdBZ3R1BCHCd-mG9vzTQLzpT0N9cn8_rA0BhmVJ88N0t2A/viewform?usp=share_link

**විවෘත කාණ්ඩය -**
https://docs.google.com/forms/d/e/1FAIpQLSfrNkicHf-M7XEAHI4daa4r_f2ekpD0z8n8xn-SwCpfGZvjgA/viewform?usp=share_link

## විනිශ්චය කිරීමේ ක්‍රමය

1. එවන ලද සියලුම නිර්මාණ ප්‍රථම වටයේ විනිශ්චය සඳහා යොමු කරනු ලැබේ.
2. ප්‍රථම වටයේ විනිශ්චයෙන් දෙවන වටය සඳහා එක් එක් තරග කාණ්ඩයෙන් නිර්මාණ 50 ක් තෝරාගනු ලැබේ.
3. දෙවන වටයේ විනිශ්චයෙන් තෙවන වටය සඳහා ළමා 1 කාණ්ඩයෙන් නිර්මාණ 10 ක්, ළමා II කාණ්ඩයෙන් නිර්මාණ 10 ක් සහ විවෘත කාණ්ඩයෙන් නිර්මාණ 20 බැගින් ද තෝරාගනු ලැබේ.
4. අවසාන වටයේදී එක් එක් කාණ්ඩයෙන් ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන සඳහා නිර්මාණ තෝරාගනු ලබන අතර ඉතිරි නිර්මාණ සඳහාද ත්‍යාග සහ සහතිකපත් පිරිනැමේ.

# <u>ත්‍යාග සහ සහතික පත්</u>

| ස්ථානය | ළමා කාණ්ඩය 1 | ළමා කාණ්ඩය 2 | විවෘත කාණ්ඩය |
|---|---|---|---|
| 1. ප්‍රථම ස්ථානය | මුදල් ත්‍යාගය රු.20,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු.40,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු.100,000/= සමඟ සහතිකය |
| 2. දෙවන ස්ථානය | මුදල් ත්‍යාගය රු.10,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු.20,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු.40,000/= සමඟ සහතිකය |
| 3. තෙවන ස්ථානය | මුදල් ත්‍යාගය රු. 5,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු.10,000/= සමඟ සහතිකය | මුදල් ත්‍යාගය රු. 20,000/= සමඟ සහතිකය |
| ඇගයීම් සහතික | | | |
| විශිෂ්ට සම්මාන සහතික | විශිෂ්ට කුසලතා සහතිකය රු.2,500/= බැගින් 2 ක් | විශිෂ්ට කුසලතා සහතිකය රු.5,000/= බැගින් 2 ක් | විශිෂ්ට කුසලතා සහතිකය රු.10,000/= බැගින් 2 ක් |
| සම්මාන සහතික | සම්මාන සහතික රු.1000/= බැගින් 5ක් | සම්මාන සහතික රු.2,000/= බැගින් 5ක් | සම්මාන සහතික රු.4,000/= බැගින් 5 ක් |
| කුසලතා සහතික | කුසලතා සහතික 10 ක් | කුසලතා සහතික 10 ක් | කුසලතා සහතික රු.2,000/= බැගින් 10 ක් |

| | | |
|---|---|---|
| ECF සංවිධානයෙන් පිරිනමන සහතික - | විවෘත අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |
| | ළමා අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |
| ජපානයේ ස්පුට්නික් සංවිධානයෙන් පිරිනමන සහතික - | ළමා අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |
| | විවෘත අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |
| තායිලන්තයෙන් පිරිනමන සහතික - | ළමා අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |
| | - විවෘත අංශයෙන් ඇගයීම් කුසලතා සහතික | 1 |

රටේ පවතින නීතිය හා වත්මන් තත්වයට අනුව මෙහි අඩංගු ඕනෑම කරුණක් හෝ තරග කොන්දේසියක් වෙනස්වීම් වලට ලක්විය හැකි අතර විනිශ්චය මණ්ඩලය හා සංවිධායක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන බව ප්‍රකාශ කර සිටිමි.

Dr. Eshantha Ariyadasa
Chairman
Sputnik International Sri Lanka Organization (SISLO)
Negombo Road, Gepallawa, Uhumeeya, Kurunegala, Sri Lanka.
Tel: 037 2238600, Fax: 037 2228900

.................................................................

ආචාර්ය එශාන්ත ආරියදාස,

සභාපති - ස්පුට්නික් ජාත්‍යන්තර ශ්‍රී ලංකා සංවිධානය.